# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1553/19 - 2008 ජුනි 11 වැනි බදාදා- 2008.06.11

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාත් සභාව

බස්නාහිර පළාතේ 1990 අංක 06 දරන මුදල් ප්‍රඥප්තිය

**7 (1) වගන්තිය යටතේ නියෝගය**

බස්නාහිර පළාතේ, පළාත් සභාවේ 1990 අංක 06 දරන මුදල් ප්‍රඥප්තියේ 7 (1) දරන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, බස්නාහිර පළාතේ, පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල්, ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, පළාත් පාලන, පළාත් පරිපාලන, අධ්‍යාපන, ප්‍රවාහන, රැකී රක්ෂා, සංස්කෘතික හා කලා කටයුතු පිළිබඳ අමාත්‍ය පේස්තේරුවේ ලියනරාළලාගේ රෙජිනෝල්ඩ් රොස්මන්ඩ් කුරේ විජයවර්ණසූරිය වන මම, එකී වගන්තිය යටතේ සාදා 1990.11.20 වැනි දින සහ අංක 637/8 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියෝගය සහ එම නියෝගය යටතේ සාදා 2006.12.19 වැනි දින සහ අංක 1476/11 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද අවසන් වරට සංශෝධනය කරන ලද්දාවූ නියෝගය සහ 1998.06.23 දින සහ අංක 1033/6 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියෝගය තොග හා සිල්ලර වෙළඳාම මත 2008.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත දැක්වෙන ලෙස සංශෝධනය කරමි.

***නියෝග***

| | | | |
|---|---|---|---|
| 1. | (අ) | මැණික් විකිණීමේ ව්‍යාපාරයේ පිරිවැටුම සම්බන්ධයෙන් | සියයට 05 |
| | (ආ) | ඉරන ලද ලී හෝ ලී කොට වශයෙන් දැව විකිණීමේ ව්‍යාපාරයේ පිරිවැටුම සම්බන්ධයෙන් | සියයට 05 |
| | (ඉ) | වටිනා හෝ අර්ධ වශයෙන් වටිනා ගල් විකිණීමේ ව්‍යාපාරයේ පිරිවැටුම සම්බන්ධයෙන් | සියයට 05 |
| | (ඊ) | ලී බඩු විකිණීමේ ව්‍යාපාරයේ පිරිවැටුම සම්බන්ධයෙන් | සියයට 05 |
| | (උ) | රත්‍රං විකිණීමේ ව්‍යාපාරයේ පිරිවැටුම සම්බන්ධයෙන් | සියයට 05 |
| | (ඌ) | ස්වර්ණාභරණ සහ ඇඳුම් ආයිත්තම් සඳහා වූ ස්වර්ණාභරණ විකිණීමේ ව්‍යාපාරයේ පිරිවැටුම සම්බන්ධයෙන් | සියයට 05 |
| | (එ) | අරක්කු (පදම් කළ අරක්කු, කවලම් අරක්කු ඇතුළුව), බීර, වයින්, රා සහ වෙනත් ආනයනික හෝ මෙරට නිෂ්පාදිත මත්පැන් වර්ග විකිණීමේ හෝ මිලට ගෙන විකිණීමේ ව්‍යාපාරයේ පිරිවැටුම සම්බන්ධයෙන් | සියයට 05 |
| | (ඒ) | සිගරට් නිෂ්පාදකයා වෙතින් හෝ සිගරට් ආනයනකරු වෙතින් ගෙන විකිණීමේ හෝ මිලට ගෙන විකිණීමේ ව්‍යාපාරයේ පිරිවැටුම සම්බන්ධයෙන් | සියයට 05 |

1A - PG 000915— 930 (2008/06)

| | | |
|---|---|---|
| (ඔ) | සියළුම වර්ගයේ, මෝටර් රථ වාහන, මෝටර් සයිකල්, ත්‍රීරෝද රථ, ටේලරය සහිත හෝ රහිත ට්‍රැක්ටර්, අත් ට්‍රැක්ටර් විකිණීමේ හෝ මිලට ගෙන විකිණීමේ ව්‍යාපාරයේ පිරිවැටුම සම්බන්ධයෙන් | සියයට 05 |
| (ඕ) | පෙට්‍රල්, ඩීසල්, භූමිතෙල්, ලිහිසි තෙල් වර්ග විකිණීමේ හෝ මිලට ගෙන විකිණීමේ ව්‍යාපාරයේ පිරිවැටුම සම්බන්ධයෙන් | සියයට 02 |
| (ක) | ඉහත (අ), (ආ), (ඉ), (ඊ), (උ), (ඌ), (එ), (ඒ), (ඔ) හා (ඕ) යටතේ සඳහන් යම් ව්‍යාපාරයක් හැර යම් ද්‍රව්‍යයක් හෝ වෙළඳ ද්‍රව්‍යයන් විකිණීමේ හෝ මිලට ගෙන විකිණීමේ ව්‍යාපාරයේ පිරිවැටුම සම්බන්ධයෙන් | සියයට 01 |

පේස්තේරුවේ ලියනරාළලාගේ රෙජිනෝල්ඩ් රොස්මන්ඩ් කුරේ විජයවර්ණසූරිය,
බස්නාහිර පළාතේ, පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල්, ක්‍රම සම්පාදන,
නීතිය හා සාමය, පළාත් පාලන, පළාත් පරිපාලන, අධ්‍යාපන,ප්‍රවාහන,
රැකී රක්ෂා, සංස්කෘතික හා කලා කටයුතු පිළිබඳ අමාත්‍ය.

2008 ජුනි මස 10 වැනි දින,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලය (බ.ප),
ශ්‍රාවස්ති මන්දිරය,
කොළඹ 07.

06-502/1

---

**බස්නාහිර පළාත් සභාව**

බස්නාහිර පළාතේ 2006 අංක 02 දරන මුදල් (සංශෝධන ) ප්‍රඥප්තිය

**98 (3) වගන්තිය යටතේ නියෝගය**

බස්නාහිර පළාතේ, පළාත් සභාවේ 2006 අංක 02 දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තියේ 98 (3) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර බස්නාහිර පළාතේ, පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල්, ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, පළාත් පාලන, පළාත් පරිපාලන, අධ්‍යාපන, ප්‍රවාහන, රැකී රක්ෂා, සංස්කෘතික හා කලා කටයුතු පිළිබඳ අමාත්‍ය, පේස්තේරුවේ ලියනරාළලාගේ රෙජිනෝල්ඩ් රොස්මන්ඩ් කුරේ විජයවර්ණසූරිය වන මම, එකී වගන්තිය යටතේ සාදා 2008.04.04 දින සහ අංක 1543/39 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියෝගය 2008.06.10 දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත දැක්වෙන ලෙස සංශෝධනය කරමි.

(I) උප ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් උප ඡේදය ආදේශ කිරීමෙන්,

(i) බස්නාහිර පළාත තුළ පවත්වනු ලබන සෑම තැගි තරගයකදීම පිරිනමනු ලබන ත්‍යාගවල මුළු වෙළඳ වටිනාකම මත මෙහි පහත සඳහන් ආකාරයෙන් ගණනය කරනු ලබන අනුප්‍රමාණ බද්දක් අය කරනු ලැබේ.

| *ත්‍යාගවල වටිනාකම* | *බදු අනුප්‍රමාණය* |
|---|---|
| රුපියල් ලක්ෂයට අඩු නම් | බදු නිදහස් |
| ත්‍යාගවල මුළු වෙළඳ වටිනාකම මතම බදු අය කරනු ලැබේ. | 20% |

පේස්තේරුවේ ලියනරාළලාගේ රෙජිනෝල්ඩ් රොස්මන්ඩ් කුරේ විජයවර්ණසූරිය,
බස්නාහිර පළාතේ, පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල්, ක්‍රම සම්පාදන,
නීතිය හා සාමය, පළාත් පාලන, පළාත් පරිපාලන, අධ්‍යාපන,ප්‍රවාහන,
රැකී රක්ෂා, සංස්කෘතික හා කලා කටයුතු පිළිබඳ අමාත්‍ය.

2008 ජුනි මස 10 වැනි දින,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලය (බ.ප),
ශ්‍රාවස්ති මන්දිරය, කොළඹ 07.

06-502/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.